## දැක්ම

යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීම සඳහා, ආණ්ඩුවේ නොයෙකුත් ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කරමින් ශ්‍රී ලංකා ජනරජයට සහාය වීම.

## මෙහෙවර

ආණ්ඩුවේ ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීමේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ඊට අදාළ පනත් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සම්පාදනය කිරීම.

# හැඳින්වීම

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව "ඒ" ශ්‍රේණියේ රාජ්‍ය දෙපාර්තමේන්තුවකි. අතිගරු ජනාධිපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතේ පැවති මෙම දෙපාර්තමේන්තුව අංක 1897/15 හා 2015.01.18 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතට පත් වූ අතර, අංක 1933/13 හා 2015.09.21 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව අධිකරණ අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ කටයුතු කරයි.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යභාරය වනුයේ, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද තීරණ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, විවිධ විෂයයන් පිළිබඳ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ලිඛිත නීති බවට පරිවර්තනය කිරීම වේ. එසේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීමේ කාර්යාවලියේ දී, දෙපාර්තමේන්තුව විසින්, නව නීති පැනවීම සඳහා පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම, පවත්නා නීති සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම සහ ආණ්ඩුවේ විවිධ අමාත්‍යාංශවලින් ඉදිරිපත් කරන උපකාරක නීති ප්‍රතිශෝධනය කිරීම සිදුකරයි. පනත් කෙටුම්පත් සමාලෝචනය කිරීම සඳහා වන පාර්ලිමේන්තු තේරීම් කාරක සභා රැස්වීම්වලට සහභාගීවීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේ දී පාර්ලිමේන්තුව සමඟ සම්බන්ධීකරණය පවත්වා ගනිමින් අවශ්‍ය කටයුතු කිරීම දෙපාර්තමේන්තුවට පැවරී ඇති අනෙකුත් රාජකාරි කටයුතු වේ. මෙම දෙපාර්තමේන්තුව, සියලු රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ද ඇතුළුව ආණ්ඩුවේ සියලු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත සේවා සලසයි. පනත් කෙටුම්පත් සහ උපකාරක නීති සැකසීම සම්බන්ධයෙන් නොයෙකුත් ආණ්ඩුවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට නෛතික උපදෙස් ලබාදීම ද, දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

**1. පනත් කෙටුම්පත් සම්පාදනය කිරීමට අදාළ ව දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය වනුයේ:-**

(1) නව නීති පැනවීම සඳහා ද පවත්නා නීති සංශෝධනය කිරීම සඳහා ද භාෂාත්‍රයෙන් පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම.

(2) උපකාරක නීති භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම සහ (අවශ්‍ය අවස්ථාවල දී) උපකාරක නීති කෙටුම්පත් කිරීම.

(3) නීති සම්පාදනය හා සම්බන්ධ පාර්ලිමේන්තු රාජකාරි ඉටු කිරීම.

(4) අවශ්‍ය අවස්ථාවල දී පළාත් සභා සඳහා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම.

(5) පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් (සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත්) භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම.

පනත්, උපකාරක නීති, සහ පළාත් සභා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීමේ දී ඒ සම්බන්ධව අවශ්‍ය වන නෛතික උපදෙස් ලබා දීම ද මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.

මෙම දෙපාර්තමේන්තුවේ විශේෂ ලක්ෂණය වන්නේ, එයටම සීමා වූ වැඩසටහනක් නොතිබීම යි. අමාත්‍ය මණ්ඩලය විසින් නියමිත ප්‍රතිපත්ති අනුමත කිරීමෙන් පසුව, ආණ්ඩුවේ අමාත්‍යාංශවල හා එම අමාත්‍යාංශ යටතේ ඇති විවිධ දෙපාර්තමේන්තුවල ව්‍යවස්ථා සම්පාදන අවශ්‍යතා මත දෙපාර්තමේන්තුවේ වැඩසටහන සකස් වී තිබීම ඊට හේතුවයි. එබැවින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය, යම් නිශ්චිත වර්ෂයක් මුළුල්ලේ ප්‍රාථමික නීති, නීති සංශෝධන හා උපකාරක නීති සම්බන්ධයෙන් අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හා එම ඉල්ලීම් සාර්ථකව නිම කිරීම යන පදනම මත සකස් වී ඇත. දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වන නීති සම්පාදනයෙහි විෂය පථයට ඇතුළත් වන කවර ආකාරයක හෝ වූ නීති, එය ඉල්ලා සිටින අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට මුදා හැරීමට පෙර භාෂා තුනෙන් ම සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

## 2. කාර්ය මණ්ඩලය

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල සංයුතිය පහත සඳහන් පරිදි වේ. අනුමත ඒකාබද්ධ කාර්ය මණ්ඩලය 148 ක් වන අතර 2017.12.31 වන දිනට සේවයේ නියුතුව සිටි කාර්ය මණ්ඩලය 105 ක් වේ.

| තනතුරු වර්ග | අනුමත කාර්ය මණ්ඩලය | සේවයේ නියුතුව සිටින කාර්ය මණ්ඩලය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 42 | 29 |
| තෘතීය මට්ටම | 28 | 14 |
| ද්විතීය මට්ටම | 54 | 40 |
| ප්‍රාථමික මට්ටම | 24 | 22 |

| 2017.12.31 දිනට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | | | තෘතීය මට්ටම | | | ද්විතීය මට්ටම | | | ප්‍රාථමික මට්ටම | | |
| | අනුමත | තත්‍ය | | අනුමත | තත්‍ය | | අනුමත | තත්‍ය | | අනුමත | තත්‍ය |
| නීති කෙටුම්පත් සම්පාදක | 01 | 01 | පරිපාලන නිලධාරී | 01 | 01 කොන්ත්‍රාත් | සංවර්ධන සහකාර | 02 | - | රියදුරු | 10 | 09 |
| අතිරේක නීති කෙටුම්පත් සම්පාදක | 01 | 01 | ප්‍රධාන භාෂා පරිවර්තක | 02 | 01 | පුස්තකාලයාධිපති | 01 | 01 | කාර්යාල කාර්ය සහායක | 14 | 13 |
| නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක | 05 | 05 | භාෂා පරිවර්තක | 24 | 11 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 20 | 17 | | | |
| ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක | 08 | 01 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 01 | 01 | ලේඛන සහකාර | 20 | 15 | | | |
| සහකාර නීති කෙටුම්පත් සම්පාදක | 25 | 20 | | | | සංස්කාරක | 11 | 07 | | | |
| ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | | | | | | | | | |
| සහකාර අධ්‍යක්ෂ | 01 | - | | | | | | | | | |
| එකතුව | 42 | 29 | | 28 | 14 | | 54 | 40 | | 24 | 22 |
| මුළු එකතුව | | | | අනුමත ගණන : 148 | | | තත්‍ය ගණන : 105 | | | | |

**දෙපාර්තමේන්තුවේ පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග**

දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යභාරය ඉටුකිරීම සඳහා අනුමත සේවක සංඛ්‍යාව 148 කි. එසේ වුව ද එකී කාර්යභාරය ඉටුකිරීම සඳහා දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂයේ තත්‍ය සේවක සංඛ්‍යාව 105 ක් පමණි. මෙහි පහත දක්වා ඇති පරිදි විවිධ සේවා ගණවල සේවා නියුක්තිය සම්බන්ධයෙන් පුරප්පාඩු 43 ක් ඇත :-

**ජ්‍යෙෂ්ඨ මට්ටම**

(අ) නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක ධුරයේ පුරප්පාඩු නැත. ස්ථිර නිලධාරීන් 05ක් ඇත.

(ආ) ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරු 07 ක් පුරප්පාඩුව පවතී. අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම්ලත් එනම්, වසර දහයක (10) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහකාර නීති කෙටුම්පත් සම්පාදක නිලධාරීන් නොමැති බැවින් එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට දැනට සිටින සහකාර නීති කෙටුම්පත් සම්පාදක නිලධාරීන් අදාළ සේවා කාලය සම්පූර්ණ කළ යුතු ය.

(ඇ) සහකාර නීති කෙටුම්පත් සම්පාදක පුරප්පාඩු 05ක් ඇත. එම පුරප්පාඩු පිරවීමට පෙර මෙම තනතුරු සඳහා අදාළ බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කළ යුතුව ඇති බැවින් ඒ සඳහා අවශ්‍ය කටයුතු කර අදාළ ආයතන වෙත යවා ඇත.

**තෘතීය මට්ටම**

පරිපාලන නිලධාරී තනතුර පුරප්පාඩුව පවතී. කොන්ත්‍රාත් ක්‍රමය මත බඳවාගත් නිලධාරිනියක් ඇත. පුරප්පාඩුව සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවා ඇති අතර, පිළිතුරු මේ වන තෙක් ලැබී නොමැත.

(අ) භාෂා පරිවර්තක තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා 2016.09.04 දින ලිඛිත විභාගයක් පවත්වන ලද අතර සිංහල/දෙමළ අයදුම්කරුවන් 16 දෙනෙකු විභාගය සමත්ව තිබුණි. එයින් සුදුසුකම්ලත් සිංහල මාධ්‍ය සඳහා 10 දෙනෙකු සහ දෙමළ මාධ්‍ය සඳහා 03 දෙනෙකු පමණක් වැඩ භාර ගන්නා ලදී.

(ආ) ඒ අනුව 2017.12.31 දින වන විට පුරප්පාඩු සංඛ්‍යාව 13 ක් වේ.

ඉංග්‍රීසි/සිංහල භාෂා පරිවර්තක තනතුරු - 05 ක් සහ

ඉංග්‍රීසි/දෙමළ භාෂා පරිවර්තක තනතුරු - 08 ක්, පවතී.

වැටුප් ක්‍රමයේ පවතින දුර්වලතා නිසා සේවයේ රඳවා ගැනීමට අපහසු වේ. ඒ අනුව මෙම තනතුරු සඳහා අදාළ බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කළ යුතුව ඇති බැවින් ඒ සඳහා වැටුප් ක්‍රමය සංශෝධනය කර නිර්දේශ සමඟ අනුමතය සඳහා අදාළ ආයතන වෙත ඉදිරිපත් කර ඇත.

<u>ද්විතීය මට්ටම</u>

(අ) සංවර්ධන සහකාර නිලධාරි දෙදෙනෙකු ලබාදෙන ලෙස 2016.10.11 දින දරන ලිපිය මඟින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇත.

(ආ) 2017.12.31 දිනට ලේඛන සහකාර තනතුරෙහි පුරප්පාඩු 05 ක් හා සංස්කාරක තනතුරෙහි පුරප්පාඩු 04 ක් පවතී. 2016 වසරෙහි ලිඛිත විභාගයක් පවත්වා එහි ප්‍රතිඵල මත නැවත 2016.08.23 දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වා එම ප්‍රතිඵල මත 2016.09.15 දින ලේඛන සහකාර 08 දෙනෙක් සහ සංස්කාරක 08 දෙනෙක් බඳවා ගන්නා ලදී. මේ වන විට එම පිරිසගෙන් ද ලේඛන සහකාර තනතුරු 01 ක් සහ සංස්කාරක තනතුරු 02 ක් හැර ගොස් තිබේ. වැටුප් ක්‍රමයේ පවතින දුර්වලතා නිසා සේවයේ රඳවා ගැනීමට අපහසුතාවයක් පවතී.

<u>ප්‍රාථමික මට්ටම</u>

(අ) රියදුරු සේවයේ එක් පුරප්පාඩුවක් පවතී. පුරප්පාඩුව සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවා ඇත.

(ආ) කාර්යාල කාර්ය සහායක එක් පුරප්පාඩුවක් පවතී. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවා ඇත.

**3. දෙපාර්තමේන්තුවේ අංශ**

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්යය පහත සඳහන් අංශ මඟින් ක්‍රියාත්මක වේ.

නීති කෙටුම්පත් සම්පාදන අංශය

ආයතන හා පාලන අංශය

භාෂා පරිවර්තන අංශය

ප්‍රකාශන අංශය

ගිණුම් අංශය

# නීති කෙටුම්පත් සම්පාදන අංශය

**ක්‍රියාත්මක කරන ප්‍රධාන කාර්යයන් :-**

- ආණ්ඩුවේ ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීම.
- නව නීති පැනවීමට සහ නීති සංශෝධනය කිරීමට භාෂාත්‍රයෙන් පනත් කෙටුම්පත් සකස් කිරීම.
- ආණ්ඩුවේ නොයෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවල දී නෛතික උපදෙස් ලබා දීම.
- නීති සම්පාදනය හා සම්බන්ධ පාර්ලිමේන්තු රාජකාරි ඉටු කිරීම.
- පළාත් සභා සඳහා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම.

# <u>ප්‍රගති සමාලෝචනය - 2017.01.01 - 2017.12.31</u>

| | 01 | 02 | 03 | 04 | 05 | 06 | 07 | 08 | 09 | 10 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රාජකාරියේ ස්වභාවය | **2017.01.01** දිනට කෙටුම්පත් කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් භාර දී නීතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තු වෙන් ඉතිරිව පවතින ඉල්ලීම් සංඛ්‍යාව (ඉදිරියට ගෙනා ශේෂය) | **2017.01.01** දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව (ඉදිරියට ගෙනා ශේෂය) | මෙම වර්ෂය තුළ පාර්ශ්ව යන් වෙතින් ලැබුණු නව ඉල්ලීම් සංඛ්‍යාව | පසුගිය වර්ෂ වල හා මෙම වර්ෂයේ දී භාෂාත්‍රයෙන් කෙටුම්පත් කර අවසන් කර එහෙත් නැවත වරක් සංශෝධන සිදු කිරීම සඳහා ලද ඉල්ලීම් සංඛ්‍යාව | එකතුව | **2017.12.31** දිනට කෙටුම්පත් සකස් කර භාෂාත්‍රයෙන් අදාළ පාර්ශ්වයන් වෙත ලබා දුන් සංඛ්‍යාව (කිහිප වරක් භාෂාත්‍රයෙන් සකස් කර අදාළ පාර්ශ්වයන් වෙත භාර දුන් අවසන් කෙටුම්පත්වල ඒ ඒ වාරයන් සියල්ල ම එහි ඇතුළත් වේ) | දීර්ඝ කාලීනව උපදෙස් නොමැතිව වසන ලද ගොනු | **2017.12.31** දිනට කෙටුම්පත් කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් භාර දී නීතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් සංඛ්‍යාව | **2017.12.31** කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව |
| 1. | පනත් කෙටුම්පත් කිරීම (මූලික හා සංශෝධන නීති ) | 138 | 21 | 73 | 27 | 259 | 63 | 30 | 156 | **10** |
| 2. | පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත්) | 108 | | 32 | | 140 | 9 | 1 | **130** | |
| 2. | උපකාරක නීති ප්‍රතිශෝධන | 119 | 17 | 156 | 49 | 341 | 184 | - | 126 | **31** |
| 3. | පළාත් සභා ප්‍රඥප්ති | 23 | 2 | 2 | - | 27 | 2 | 16 | 8 | **1** |

**පැහැදිලි කිරීම**

මෙම දෙපාර්තමේන්තුව විසින් අවධානය යොමුකර සම්පූර්ණ කරනු ලැබ කෙටුම්පත් යවනු ලැබුවා වූ ඉල්ලීමක්, ප්‍රධාන වශයෙන් උපදෙස් ලබාදෙනු ලබන නියෝජ්‍යායතන විසින් තම ප්‍රතිපත්තිය නිරන්තරයෙන් වෙනස් කිරීමේ හේතුව මත, තවදුරටත් වූ සංශෝධන සඳහා අලුත් උපදෙස් ද සමඟ ඉදිරිපත් කරනු ලැබේ. එසේ වුවද එවැනි ඉල්ලීමක් ලැබුණ විට එම ඉල්ලීමට අදාළ කෙටුම්පත අවසාන වශයෙන් සකස් කර තිබීම නොසලකා අලුතින් සිදුකරනු ලබන ඉල්ලීමක් සඳහා මෙන් එම ඉල්ලීම පිළිබඳව නැවත අවධානය යොමු කිරීමට හා කාලය වැය කිරීමට මෙම දෙපාර්තමේන්තුවට සිදු වේ. වැඩිදුරටත් සම්පූර්ණ කරන ලද කෙටුම්පත් සඳහා එවැනි සංශෝධන සිදුකිරීමට කරනු ලබන ඉල්ලීම් අවසාන කෙටුම්පත භාෂාත්‍රයෙන් යවනු ලැබීමෙන් පසුව ද සිදු කරනු ලබන අතර ඇතැම්විට එම කාර්ය පටිපාටිය නැවත නැවතත් වාර ගණනක් ඉටු කිරීමට සිදු වේ. පහතින් ඒ සඳහා නිදසුන් ඉදිරිපත් කර ඇත.

| **පනත් කෙටුම්පතේ නම** | **කෙටුම්පත් යවා ඇති වාර ගණන (2017.12.31 දිනට)** |
|---|---|
| **ජාතික විගණන පනත් කෙටුම්පත** | **22** |
| **මෝටර් ප්‍රවාහන (සංශෝධන) පනත් කෙටුම්පත** | **23 (සම්මත වී ඇත)** |
| **රජයේ ඉඩම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත** | **14** |
| **ඉඩම් බැංකු පිහිටුවීමේ පනත් කෙටුම්පත** | **14** |
| **ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත** | **14** |
| **ජෙනරාල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල (සංශෝධන)පනත් කෙටුම්පත** | **11** |
| **ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත් කෙටුම්පත** | **15 (කාරක සභා සංශෝධන ඇතුළත්ව සම්මත වී ඇත)** |
| **ස්වේච්ඡා සමාජ සේවා (ලියාපදිංචි කිරීමේ හා අධීක්ෂණය කිරීමේ සංශෝධිත) (සංශෝධන) පනත් කෙටුම්පත** | **12** |
| **ජාතික අක්ෂි බැංකු පනත් කෙටුම්පත** | **09** |
| **පළාත් පාලන මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත** | **15 (කාරක සභා සංශෝධන ඇතුළත්ව සම්මත වී ඇත)** |

එහෙයින්, මෙම දෙපාර්තමේන්තුව විසින් යම් ඉල්ලීමක් සඳහා අවධානය යොමුකර එය සම්පූර්ණ කර තිබුණ ද ඉහත හේතුව මත එම ඉල්ලීම තවදුරටත් මෙම දෙපාර්තමේන්තුව විසින් "කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීමක්" වශයෙන් පෙන්නුම් කරනු ලැබේ.

පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත්

අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ උපදෙස් පරිදි විගණන පනත, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත හා රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ පනත සම්මත වනතෙක් පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත් (වෘත්තීමය ආයතනයන් සම්බන්ධයෙන් වන පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත් හැර) සම්බන්ධ කටයුතු නැවත අප වෙත දන්වන තුරු තාවකාලිකව නතර කර ඇත. එම හේතුව නිසා 2017.12.31 දින වනවිට පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත් කිරීම අවසන් නොවී නවතා ඇති ප්‍රමාණය 130 කි.

පනත් කෙටුම්පත් (මූලික හා සංශෝධන නීති)

පනත් කෙටුම්පත් (මූලික හා සංශෝධන නීති) අවසන් නොවූ ඉල්ලීම් 10 කි. අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල උපදෙස් හෝ නිරීක්ෂණ හෝ අවශ්‍ය කැබිනට් අනුමතය ලැබී නොමැති හෝ තවමත් සාකච්ඡා මට්ටමින් පවතින හෝ ඒවා වේ.

උපකාරක නීති ප්‍රතිශෝධනය

උපකාරක නීති ප්‍රතිශෝධනය කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව 31 කි. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල උපදෙස් හෝ නිරීක්ෂණ හෝ අවශ්‍ය වන හෝ තවමත් සාකච්ඡා මට්ටමින් පවතින හෝ ඒවා වේ.

## ආයතන හා පාලන අංශය

ආයතන හා පාලන අංශය මගින් කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, උසස් කිරීම, පුහුණු කිරීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම හා විනය කටයුතු, ප්‍රවාහන පහසුකම් හා සම්බන්ධ කටයුතු සහ දෙපාර්තමේන්තුවේ අනෙකුත් සියලු ආයතනික හා පරිපාලන කටයුතු ඉටු කරනු ලබයි.

## (1) පුහුණු කිරීම්

### දේශීය පුහුණු කිරීම්

**දේශීය පුහුණු කිරීම් පහත දක්වා ඇති පරිදි නිලධාරීන්ට ලබාදෙන ලදි.**

| ආයතනය | තනතුර | සහභාගී වූ නිලධාරීන් ගණන | පාඨමාලාව |
|---|---|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය | සහකාර නීති කෙටුම්පත් සම්පාදක | 01 | දර්ශනපති/ආචාර්ය උපාධිය 2017 (දෙවන වසර) |
| | සහකාර නීති කෙටුම්පත් සම්පාදක | 01 | දර්ශනපති/ආචාර්ය උපාධිය 2017 |
| | සහකාර නීති කෙටුම්පත් සම්පාදක | 01 | මානව අයිතීන් පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (2018/2019) |
| සාර්ක් | සහකාර නීති කෙටුම්පත් සම්පාදක | 02 | 14 වන සාර්ක් නීති සමුළුව |
| ශ්‍රී ලංකා පුස්තකාල සංගමය | පුස්තකාලයාධිපති | 01 | පුස්තකාල සහ තොරතුරු විද්‍යාව පිළිබඳ ජාතික සමුළුව |
| මිලෝදා ආයතනය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 | පඩි ලැයිස්තුව පිළිබඳ පුහුණු වැඩසටහන |
| කම්කරු අධ්‍යාපනය පිළිබඳ ජාතික ආයතනය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 | මූලික ගබඩා කළමනාකරණය |
| | | 01 | නිෂ්පාදන මෙවලමක් ලෙස සුපිරි එස් පහ |
| | | 01 | ස්ථාවර වත්කම් කළමනාකරණය |

| | | | |
|---|---|---|---|
| | | 01 | ගිණුම්කරණය හා පරිචයන්ගේ භූමිකාව |
| පී.ආර්.ඒ.ජී. ආයතනය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 | කාර්යාලීය වැඩ සඳහා එක්සෙල් භාවිතය |
| | | 01 | බඳවාගැනීම් පටිපාටිය |

**විදේශීය පුහුණු**

| නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වූ විදේශ පුහුණු - 2017 වර්ෂය | | |
|---|---|---|
| | පුහුණුවේ නම සහ පැවැත් වූ රට | සහභාගී වූ නිලධාරියාගේ නම |
| 1. | ආසියානු නීති සමුළුව 2018 - ජපානය<br>2017 සැප්තැම්බර් මස 18 වන දින සිට 21 වන දින දක්වා | නීති කෙටුම්පත් සම්පාදක<br>ඩී. එස්. එච්. කුමාරජීව මහත්මිය |
| 2. | උසස් නීති ව්‍යවස්ථා කෙටුම්පත් කිරීම පිළිබඳ පාඨමාලාව<br>2017 ඔක්තෝබර් මස 9 වන දින සිට 20 වන දින දක්වා | අතිරේක නීති කෙටුම්පත් සම්පාදක<br>කේ. ආර්.වයි. හපුආරච්චි මහත්මිය<br><br>නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක<br>ටී.ඒ.වයි.එම්. රණවන මහත්මිය |
| 3. | ජාත්‍යන්තර නීති ව්‍යවස්ථා කෙටුම්පත් කිරීම - 2016 - පොදු නීති මධ්‍යස්ථානය, නිව් ඕලියන්ස්, ලුසියානා, ඇමෙරිකා එක්සත් ජනපදය<br>2017 ජුනි මස 5 වන දින සිට 16 වන දින දක්වා | සහකාර නීති කෙටුම්පත් සම්පාදක<br>එම්.ඒ.කේ.ඒ. මැදගොඩ මෙනවිය<br><br>සහකාර නීති කෙටුම්පත් සම්පාදක<br>වී.එස්. තුෂාරි මහත්මිය<br><br>සහකාර නීති කෙටුම්පත් සම්පාදක |

| | | |
|---|---|---|
| | | ඒ.කේ.ඩී.ජී.අයි.කේ. අබේවික්‍රම මෙනවිය |
| 4. | නීති කෙටුම්පත් සම්පාදනය කිරීමේ පාඨමාලාව 2017 – එක්සත් රාජධානිය<br>2017 ජූනි මස 26 වන දින සිට ජූලි මස 21 වන දින දක්වා | සහකාර නීති කෙටුම්පත් සම්පාදක<br>එම්.පී. කුලරත්න මහත්මිය<br><br>සහකාර නීති කෙටුම්පත් සම්පාදක<br>ඩී.එම්.ඩී.කේ. දිසානායක මහත්මිය<br><br>සහකාර නීති කෙටුම්පත් සම්පාදක<br>ආර්. පී. කොඩිතුවක්කු මෙනවිය |
| 5. | ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ 30 වන සැට්ස් සමුළුව - පකිස්ථානය<br>2017 නොවැම්බර් මස 13 වන දින සිට 17 වන දින දක්වා | නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක<br>එස්. සෙල්වකුනපාලන් මහතා |
| 6. | TCY 18 වන මහා මණ්ඩල රැස්වීම - ප්‍රංශය<br>2017 නොවැම්බර් මස 27 වන දින සිට 30 වන දින දක්වා | සහකාර නීති කෙටුම්පත් සම්පාදක<br>එල්.ජී. පුංචිහේවා මහත්මිය |

## (2) අනෙකුත් ආයතනික හා පරිපාලන කටයුතු

i. දේශීය හා විදේශීය නීතිමය තත්ත්වයන්ගේ නව වර්ධනයන් පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම උදෙසා සහ ඒ පිළිබඳව ඔවුන්ගේ දැනුම හා හැකියාව වර්ධනය කිරීම ද උදෙසා දෙපාර්තමේන්තුවේ 1 වන ශ්‍රේණියේ පුස්තකාලයක් ස්ථාපිත කොට ඇති අතර, 2017 වර්ෂයේ දේශීය හා විදේශීය පොත් 173 ක් මිලදී ගෙන ඇත.

ii. සේවක සුභසාධනය වෙනුවෙන් පොදු සුභසාධක සංගමයක් පවතී. එමගින් 2017 වර්ෂයේ දී, සාමාජිකයන් සඳහා ණය පහසුකම් සැපයීම, කාර්ය මණ්ඩල අතර සුහදතාවය වර්ධනය කිරීම උදෙසා සංස්කෘතික උත්සව සහ අධ්‍යාත්මික වර්ධනය සඳහා ආගමික උත්සව පැවැත්වීම දෙපාර්තමේන්තුවේ සියලු කාර්ය මණ්ඩල සඳහා කුඩා පුස්තකාලයක් පවත්වාගෙන යාම ආදිය සිදු කරන ලදී.

iii. නීති නිලධාරීන්ගේ සුභසාධනය වෙනුවෙන් නීති නිලධාරීන්ගේ සංගමයක් ද ඇත. නීති නිලධාරීන්ගේ වෘත්තිමය නිපුණතා වර්ධනය මෙන්ම අනෙකුත් සුභසාධන කටයුතු මෙම සංගමය මගින් ඉටු කරයි.

## භාෂා පරිවර්තන අංශය

මෙම දෙපාර්තමේන්තුවේ නීති අංශය මඟින් ඉංග්‍රීසි බසින් සකස් කරනු ලබන නීති කෙටුම්පත් (නව නීති සහ සංශෝධන නීති) සහ ප්‍රතිශෝධනය කරනු ලබන උපකාරක නීති, අදාළ රාජ්‍ය භාෂාවලට පරිවර්තනය කිරීම ද දෙපාර්තමේන්තුවේ ආයතන, පාලන සහ ගිණුම් අංශවල රාජකාරි ලිපිලේඛන අදාළ භාෂාවලට පරිවර්තනය කිරීම ද භාෂා පරිවර්තන අංශය මඟින් සිදු කරනු ලබයි.

## ප්‍රකාශන අංශය

පනත් කෙටුම්පත් හා උපකාරක නීතිවල ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ පිටපත්වල සෝදුපත් බැලීම, පරීක්ෂා කිරීම ද පාර්ලිමේන්තුව හා රජයේ මුද්‍රණාලය විසින් එවනු ලබන පනත් කෙටුම්පත්වල අත් පිටපත් හා ගුරු පිටපත් කියවා බැලීම ද නීති නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ එවැනි පිටපත් හා සම්බන්ධ සංස්කරණ කටයුතු සිදු කිරීම කරන අතරවාරයේ දී දෙපාර්තමේන්තුව සහ පාර්ලිමේන්තුව අතර සම්බන්ධීකරණ කටයුතු කිරීම ද, පනත් ගැසට් පත්‍රයේ පළකිරීමට පියවර ගැනීම යනා දී කටයුතු නිසි ආකාරයෙන් සිදු කිරීම ද මෙම අංශය මඟින් සිදුකරනු ලබයි. එසේම නීති සම්පාදනයට අදාළ වන සියලුම ලිපිගොනු නීති නිලධරයන්හට බෙදාහැරීම ද මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.

ගිණුම් අංශය

230 නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

2017.01.01 – 2017.12.31

වැය විස්තරය

ශීර්ෂය :230 - නීති කෙටුම්පත් සම්පාදක

වැඩ සටහන : 01 මෙහෙයුම්

ව්‍යාපෘතිය : 01 සාමාන්‍ය පරිපාලනය හා නීති කෙටුම්පත් කිරීම

(අ) 2017.01.01 සිට 2017.12.31 දක්වා පුනරාවර්තන වියදම්

| පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර | අයවැය ප්‍රතිපාදන (රු.) | අමතර ප්‍රතිපාදන (රු.) | ශුද්ධ ප්‍රතිපාදන (රු.) | මුලු වියදම් (රු.) | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 83,182,000.00 | - | 83,182,000.00 | 70,495,313.18 | 84.75% |
| අනෙකුත් වියදම් | 24,080,000.00 | 1,942,000.00 | 26,022,000.00 | 25,117,915.80 | 96.53% |
| පුනරාවර්තන වියදම්වල එකතුව | 107,262,000.00 | 1,942,000.00 | 109,204,000.00 | 95,613,228.98 | 87.55% |

2017.01.01 සිට 2017.12.31 දක්වා ප්‍රාග්ධන වියදම්

| ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර | අයවැය ප්‍රතිපාදන (රු.) | අමතර ප්‍රතිපාදන (රු.) | මු.රෙ. 66 අනුව මාරු කිරීම් | ශුද්ධ ප්‍රතිපාදන (රු.) | මුලු වියදම් (රු.) | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| <u>මූලධන වත්කම් අත්පත් කර ගැනීම</u><br>2102 - ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 500,000.00 | | 53,000.00 | 553,000.00 | 551,964.83 | 99.81% |
| <u>හැකියා වර්ධනය</u><br>2401 - කාර්ය මණ්ඩල පුහුණු | 6,200,000.00 | 15,000,000.00 | | 21,200,000.00 | 20,998,462.03 | 99.05% |
| <u>වෙනත් මූලධන වියදම්</u><br>2501- ප්‍රතිව්‍යුහගත කිරීම් - ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධනය කිරීම | 6,000,000.00 | | -738,000.00 | 5,262,000.00 | 4,008,901.76 | 76.19% |
| 2506-යටිතල පහසුකම් සංවර්ධනය-නීති ග්‍රන්ථ මිළ දී ගැනීම. | 2,500,000.00 | | 685,000.00 | 3,185,000.00 | 3,181,334.00 | 99.88% |
| ප්‍රාග්ධන වියදම්වල එකතුව | **15,200,000.00** | **15,000,000.00** | **0.00** | **30,200,000.00** | **28,740,662.62** | **95.17%** |

# විසර්ජන ගිණුම 2017

වියදම් ශීර්ෂ අංකය: 230 ~~අමාත්‍යාංශයේ~~/දෙපාර්තමේන්තුවේ/~~දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ~~ නම : නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (4-5) | පිටු අංකය (අදාළ ඩී.ජී.එස්.ඒ 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| | පුනරාවර්තන | | | | | | | |
| 1 | මෙහෙයුම් වැඩසටහන | 107,262,000 | 1,942,000 | 2,185,000<br>(2,185,000) | 109,204,000 | 95,705,169 | 13,498,831 | 2 |
| | උප එකතුව (පුනරාවර්තන) | 107,262,000 | 1,942,000 | 0 | 109,204,000 | 95,705,169 | 13,498,831 | |
| | මූලධන | | | | | | | |
| 1 | මෙහෙයුම් වැඩසටහන | 15,200,000 | 15,000,000 | 738,000<br>(738,000) | 30,200,000 | 28,740,663 | 1,459,337 | 2 |
| | උප එකතුව (මූලධන) | 15,200,000 | 15,000,000 | 0 | 30,200,000 | 28,740,663 | 1,459,337 | |
| | මුළු එකතුව | 122,462,000 | 16,942,000 | 0 | 139,404,000 | 124,445,832 | 14,958,168 | |

පිටු අංක 02 සිට 16 දක්වා ඩී.ජී.එස්.ඒ 2 සිට ඩී.ජී.එස්.ඒ 10 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 17 සිට 20 දක්වා ඇතුළත් අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් තොරතුරු හා සටහන්වලට අනුකූලව පිළියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාළ ගිණුම් සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 27/03/18

ඩබ්.එම්.එම්.ආර්. අදිකාරි
ලේකම්
අධිකරණ අමාත්‍යාංශය
උපරිමාධිකරණ සංකීර්ණය
කොළඹ 12.

ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2018.03.21

දීපානි කුමාරජීව
නීති කෙටුම්පත් සම්පාදක
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
අංක. 80, අධිකරණ මාවත,
කොළඹ 12.

~~ප්‍රධාන මූල්‍ය නිලධාරි~~/ ප්‍රධාන ගණකාධිකාරි/ ~~අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)~~
නම :
දිනය : 2018.03.19

ටී.ටී. නිලන්ති ප්‍රනාන්දු
ප්‍රධාන ගණකාධිකාරී
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
කොළඹ 12

(62)

විගණකාධිපති දෙපාර්තමේන්තු

கணக்காய்வாளர் தலைமை அதிபதி திணை

AUDITOR GENERAL'S DEPARTMENT

විගණන විමසුම්-AUDIT QUERY- கணக்காய்வு விசார

විමසීම් අංකය
விசாரணை இலக்கம
Query No.. JPA/B/LDD/02/17/E/32(i)

නිකුත් කරන දිනය
வழங்கிய திகதி
Date of issue 2018 මැයි 14 දින

Addressed to
වෙතටයි

නීති කෙටුම්පත් සම්පාදක
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

විෂයය
Subject
விடயம்

විසර්ජන ගිණුම පරීක්ෂාව - 2017

මෙය පැහැදිලි කිරීම සඳහා තොරතුරු කැඳවීමක්/විමසීමක් වන අතර විගණන වාර්තාවක් නොවේ.
This is only query calling for information for clarification and not an audit report
இவ்விசாரணை தகவல்களைப் பெற்றுக் கொள்ளவும், பகுப்பாய்வதற்காகவுமே அன்றி இது ஒரு கணக்காய்வு அறிக்கை அல்ல.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම සම්බන්ධයෙන් විගණන පරීක්ෂාවක් සිදු කරන ලදි.

02. උක්ත පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු ඇතුළත් විගණන විමසුම මේ සමඟ එවා ඇත.

03. උක්ත විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් එම ඡේදයට අදාලව ඔබගේ පැහැදිලි කිරීම්, මෙම ලිපියේ දින සිට දින 02 ක් ඇතුළත මා වෙත දන්වන්නේ නම් කෘතඥ වෙමි.

අයි.එන්. ප්‍රියන්ති
විගණන අධිකාරි
නියෝජ්‍ය විගණකාධිපති වෙනුවට


අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

ශීර්ෂය 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

විසර්ජන ගිණුම් පරීක්ෂාව - 2017

---

ශීර්ෂ අංක 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුමේ D.G.S.A.8(iii) සටහනේ මුදල් රෙගුලාසි 94(2) හා (3) ප්‍රකාරව එළඹෙන බැඳීම් පිළිබඳ විස්තර ඇතුළත් කළයුතු වුවද වැය විෂයන් 03 කට අදාල බැරකම් එසේ ඇතුළත් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම් විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය රු. | මුළු වියදම රු. | ඉතිරිය රු. | බැරකම් රු. | ප්‍රතිපාදන ඉක්ම වූ බැරකම් සඳහා බැඳීම රු. |
|---|---|---|---|---|---|
| 230-01-01-1201 | 1,100,000 | 1,098,869 | 1,131 | 7,770 | 6,639 |
| 230-01-01-1402 | 2,664,000 | 2,662,437 | 1,563 | 108,806 | 107,303 |
| 230-01-01-1403 | 4,700,000 | 4,631,120 | 68,880 | 446,964 | 378,084 |

අයි.එන්. ප්‍රියන්ති

විගණන අධිකාරී

නියෝජ්‍ය විගණකාධිපති වෙනුවට

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

මගේ අංකය : **JPA/B/LDD/02/17/E/32** 2018 මැයි 17 දින.

අධ්‍යක්ෂ ජනරාල්

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව.

**ශීර්ෂ 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂයේ විසර්ජන ගිණුම පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

ශීර්ෂ 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂය සඳහා වූ 2017 දෙසැම්බර් 13 දිනැති අංක 259/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් ඩීජීඑස්ජ් 1 ආකෘතියේ සිට 10 ආකෘතිය දක්වා ආකෘතිද, සටහන (i) සිට සටහන (iv) දක්වා වූ තොරතුරු සාරාංශයකින් සමන්විත 2017 වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්ට, 2017 අංක 32 දරණ විසර්ජන ( සංශෝධන ) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනත හා වෙනත් ව්‍යවස්ථාපිත විධි විධානයන්ට, 2017 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධි විධාන ඇතුළත් රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2017 දෙසැම්බර් 13 දිනැති අංක 259/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 150 ප්‍රකාරව රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රසිද්ධ කළයුතු විසර්ජන ගිණුම සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

02. විගණන විෂය පථය

විසර්ජන ගිණුමේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන 2017 අංක 32 දරන විසර්ජන ( සංශෝධන ) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතින් පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද වියදම් සීමාවන් තුළ උපයෝජනයන් සිදු කලේද යන්න හා විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් විසර්ජන ගිණුමේ ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම

පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම විසර්ජන ගිණුමේ සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

## 03. විසර්ජන ගිණුම සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 හා 125 හි දක්වා ඇති කාර්යභාරයන් සම්බන්ධයෙන් වූ රාජ්‍ය මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු කිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් මුදල් අමාත්‍යවරයාට වගකිව යුතු අතර අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල මුදල් කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම භාණ්ඩාගාරයේ විධානයන්ට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ට හා ගණන්දීමේ නිලධාරීන්ට පැවරේ. ඒ අනුව විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්ට, වෙනත් ව්‍යවස්ථාපිත විධි විධානයන්ට, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව විසර්ජන ගිණුම පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාම මෙම වගකීමට ඇතුළත් වේ.

## 04. විගණන නිරීක්ෂණ

2017 වර්ෂය සඳහා ශීර්ෂ 230 දරන නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම පහත දැක්වෙන 4.1 ඡේදයේ සිට 4.3 දක්වා වූ කරුණු දැක්වීම්වලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

4.1 මු.රෙ. 94 හි විධි විධානයන්ගෙන් බැහැරව සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන ඉක්මවා වැය විෂයන් 02 ක් සඳහා බැරකම්වලට බැඳී තිබූ අතර ප්‍රතිපාදන ඉක්ම වූ බැරකම්වල අගය රු.107,921 ක් විය.

4.2 මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධි විධාන ප්‍රකාරව සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය ගැන නිසි සැලකිල්ලෙන් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළයුතු වුවද එපරිදි කටයුතු කර නොතිබීම හේතුවෙන් මූලධන වැය විෂයන් 01 ක් සහ පුනරාවර්තන වැය විෂයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. ඒ අනුව එම වැය විෂයන් 05 සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.970,000 කින් රු.14,224,638 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනවලින් සියයට 12 සිට සියයට 25 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

4.3 මුදල් රෙගුලාසි 50 විධි විධාන ප්‍රකාරව තාත්වික ඇස්තමේන්තු පිළියෙල නොකිරීම නිසා මුදල් රෙගුලාසි 66/69 මඟින් අවස්ථා 05 කදී රු.2,923,000 ක්ද, පරිපූරක ඇස්තමේන්තු මඟින් අවස්ථා 03 කදී රු.16,942,000 ක්ද, ඒ ඒ වැය විෂයන්හි අධි හා ඌන ප්‍රතිපාදනයන් සමනය කර ගැනීම සඳහා ලබාගෙන තිබුණි.

## 5. පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර මා විසින් ශීර්ෂ 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට අදාලව මූල්‍ය හා කාර්යසාධනය පිළිබඳ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

කේ.කේ.වී. ධර්මසිරි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් : 1. ලේකම්, අධිකරණ අමාත්‍යාංශය
2. නීති කෙටුම්පත් සම්පාදක, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

(63)

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
නො.80, අධිකරණ මාවත,
කොළඹ 12.

சட்ட வரைநர் திணைக்களம்,
இல. 80, அதிகரண மாவத்தை,
கொழும்பு 12.

තැ.පෙ. / அ.பெ / P.O.Box — 554

LEGAL DRAFTSMAN'S DEPARTMENT,
No.80, Adhikarana Mawatha,
Colombo 12.

දුරකථන தொலைபேசி/*Telephones* : 2542991, 2333394
ෆැක්ස් பெக்ஸ் /*Fax*: 2325185,2435935

විදුලි පණිවුඩ / *Telegrams* : කෙටුම්පත්, කොළඹ
: DRAFTSMAN, Colombo

*E-mail* : ldds1@sltnet.lk

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. — LDD/AC/06/06 | ඔබේ අංකය / உமது இல / Your No. — JPA/B/LDD/02/17/E/32(i) | දිනය / திகதி / Date. — 2018.05. 15 |

නියෝජ්‍ය විගණකාධිපති,

රජයේ විගණන අංශය,

5 වන මහල,

අධිකරණ අමාත්‍යාංශය,

කොළඹ 12

<u>විසර්ජන ගිණුම පරීක්ෂාව - 2017</u>

<u>ශීර්ෂ 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව</u>

උක්ත මැයෙන් වූ ඔබගේ සමාංක හා 2018.05.14 දිනැති ලිපිය හා බැදේ.

ඒ අනුව උක්ත ලිපියෙහි සඳහන් කරුණු පිළිබඳව අදාළ පැහැදිලි කිරීම් පහත පරිදි ඉදිරිපත් කරනු ලැබේ.

2017 විසර්ජන ගිණුම සඳහා D.G.S.A.8(iii) ආකෘතිය අලුතින් හඳුන්වා දී තිබූ අතර 2017 විසර්ජන ගිණුම් සකස් කිරීමට අදාළ චක්‍රලේඛයේ "බැරකම්" සහ "බැදීම්" සම්බන්ධයෙන් නිර්වචනය කිරීමක් සිදු කර නොතිබුණි.

එහෙත් "2017 මුදල් වර්ෂය සඳහා වූ ගිණුම් පියවීම" මැයෙන් 2017.10.16 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 258/2017 හි ඇමුණුම 01හි (පිටපතක් අමුණා ඇත) බැරකම් සහ බැදීම් පහත පරිදි නිර්වචනය කර ඇත.

"බැරකම්" යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලට අදාළ වත්කම් හා සේවාවන් ලැබී ඇති නමුත් ගිණුම් වර්ෂය තුලදී ඒ සඳහා අදාළ පාර්ශවයන්ට ගෙවීම් සිදු කර නොමැති ගනුදෙනුය.

"බැඳීම්" යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අදාළ වත්කම් හෝ සේවාව ආයතනය වෙත ලැබී නොමැති, එහෙත් එකී භාණ්ඩ හා සේවාවන් ලබා ගැනීමේ අරමුණින් බාහිර පාර්ශවයන් සමඟ එළඹ ඇති ගිවිසුම් හෝ ලිඛිත එකඟතාවයන්ය.

ඉහත නිර්වචනය අනුව බලන කල විගණන විමසුමේ සඳහන්ව තිබූ පහත බැරකම්වලට අදාළ භාණ්ඩ හා සේවා අදාල ගිණුම් වර්ෂය තුළ ආයතනය වෙත ලැබී තිබූ බැවින්, ඒවා "බැඳීම්" ලෙස සැලකිය නොහැකි බැවින් D.G.S.A.8(iii) සංකෘතියට ඇතුලත් නොකරන ලදී.

| වියදම් විස්තරය | බැරකම් වටිනාකම රු. | අදාළ භාණ්ඩ හෝ සේවාව පිළිබඳ විස්තරය |
|---|---|---|
| 230-01-01-1201 | 7,770.00 | 2017 දෙසැම්බර් පුවත්පත් බිල්පත |
| 230-01-01-1402 | 108,806.00 | 2017 දෙසැම්බර් දුරකථන හා අන්තර්ජාල බිල්පත් |
| 230-01-01-1403 | 446,964.00 | 2017 දෙසැම්බර් විදුලිය හා ජල බිල්පත් |

ඩී.එස්.එච් කුමාරජීව

නීති කෙටුම්පත් සම්පාදක

## ආයතනයේ කාර්ය සාධනය පිළිබඳ සාරාංශය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව විවිධ විෂයන් පිළිබඳව ආණ්ඩුවේ ප්‍රතිපත්තීන් ලිඛිත නීතිය බවට පරිවර්තනය කිරීම නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වේ. මෙම ක්‍රියාවලියේ දී නව පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම, පවත්නා නීති සංශෝධනය කිරීම, සහ අදාළ අමාත්‍යාංශ ඉදිරිපත් කරනු ලබන උපකාරක නීති ප්‍රතිශෝධනය කිරීම ද අවශ්‍ය අවස්ථාවල දී ඒවා නැවත කෙටුම්පත් කිරීම ද සිදු කරනු ලැබේ. පනත් කෙටුම්පත් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කමිටු රැස්වීම්වලට සහභාගි වීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේ දී පාර්ලිමේන්තුවට ගොස් අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ උපකාරක නීති සැකසීම සම්බන්ධයෙන් ආණ්ඩුවේ නොයෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට නෛතික උපදෙස් ලබාදීම ද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි.

තව ද, ශ්‍රී ලංකාවේ නීති ප්‍රඥප්ති නිල වශයෙන් ඒකාබද්ධ කොට සහ ප්‍රතිශෝධනය කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ප්‍රකාශයට පත්කිරීමේ වසර හතරක ව්‍යාපෘතියේ කටයුතු සිදු කරමින් පවතින අතර එම ව්‍යාපෘතිය මෙම වසර දෙසැම්බර් 31 වන දිනට අවසන් වේ. ව්‍යාපෘතියේ කාලසීමාව තවත් වසර 6 කින් දීර්ඝ කිරීම සඳහා ඉල්ලීමක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

**ව්‍යාපෘතිය වසර 06 කින් දීර්ඝ කිරීමට හේතු**

ආරම්භයේ දී ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2017 වර්ෂයේ අවසන් කිරීමට අපේක්ෂා කරනු ලැබුව ද, පනත් කෙටුම්පත්කරණයේ සුවිශේෂී නිපුණතාවයක් ඇති තැනැත්තන් විසින්ම, සියුම්ව සහ තාක්ෂණිකව ඇගයීමකට ලක්කර, බුද්ධිය මෙහෙයවා මෙම ව්‍යාපෘතියේ වැඩකටයුතු සිදුකළයුතුවීමත්, සහ එවැනි නිලධරයන් සිටිනුයේ අතලොස්සක් පමණක් වීමත්, එකී කටයුතු සිදුකළ බහුතරයක් නිලධරයන් මෙම දෙපාර්තමේන්තුවේම සාමාන්‍ය රාජකාරි සිදුකරනු ලබන නීති නිලධරයන් වීමත් හේතුවෙන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කිරීමේ දී අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා අධික ශ්‍රමයක් සහ කාලයක් වැයවන වැඩ ප්‍රමාණයක් ඉටු කිරීමට සිදුවීමත් යන කාරණා හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2017 වර්ෂය ඇතුළත අවසන් කිරීමට නොහැකි විය.

'නීති කෙටුම්පත් සම්පාදක අංශය' යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි, 2017 වර්ෂයට අදාළව නීති කෙටුම්පත් සම්පාදනය සම්බන්ධව පියවර ගෙන ඇත.

## ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගෙන ඇති ක්‍රියාමාර්ග

**ප්‍රධාන වශයෙන් ඃ**

### 1. නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීම

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියක් නොමැති වීම දීර්ඝ කාලීන ගැටලුවක් විය. එම නිසා, රජයේ ඊ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියා කිරීම සහ මහජනතාව වෙත වැඩි දැනුවත්භාවයක් ලබා දීම පිණිස දෙපාර්තමේන්තුව විසින් වෙබ් අඩවියක් නිර්මාණය කර ප්‍රවර්ධනය කිරීමට අදහස් කරන ලදී.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සහාය ඇතිව, දෙපාර්තමේන්තුව විසින් වෙබ් අඩවියක් නිර්මාණය කරනු ලැබ එම නව වෙබ් අඩවිය දැන් අන්තර්ජාලගත කර ඇති අතර URL http://Id.gov.lk හරහා එම වෙබ් අඩවියට ප්‍රවේශ විය හැකි ය.

### 2. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නීති ප්‍රඥප්ති (1956) සහ ලේඛනාගාරය ඩිජිටල්කරණය කිරීම.

ලංකාවේ නීති ප්‍රඥප්ති (1956 මුද්‍රණය) සහ එහි උපකාරක නීති නිරන්තරයෙන් භාවිත කරනු ලබන වැදගත් නීති මාලාවක් වේ. ඒවා බඳින ලද වෙළුම්වලින් පවතින නමුත් ඉතා පැරණි ඒවා වන අතර පරිහරණය කිරීමේ දී තවදුරටත් පළුදු විය හැකි තත්ත්වයක පවතී. එම නිසා, එම ලේඛන පහසුවෙන් පරිශීලනය කළ හැකි වන පරිදි සුරක්ෂිත කළ යුතු වේ. වර්තමානයේ රජයේ ගැසට්පත්‍ර වෙත අන්තර්ජාලය ඔස්සේ පරිශීලනය කළ හැකි නමුත්, පැරණි ගැසට් පත්‍ර අන්තර්ජාලයේ නොපවතින අතර පහසුවෙන් ඒ සඳහා ප්‍රවේශ විය නොහැක.

මෙවැනි පසුබිමක් යටතේ, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සහාය ඇතිව මෙම දෙපාර්තමේන්තුවේ ලේඛනාගාරයේ පවතින ගැසට් පත්‍ර (මෙහි සෑම ගැසට් පත්‍රයක්ම නොපවතී), සහ පුස්තකාලයේ පවතින නීති ප්‍රඥප්ති (1956) සහ අනෙකුත් අවශ්‍ය පනත් සුපරීක්ෂණය කර ඩිජිටල්කරණය කිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලැබීය.

සේවා සපයන්නකුගේ සේවය යොදවා ගැනීම මගින් දෙපාර්තමේන්තුව විසින් සාර්ථක ලෙස ව්‍යාපෘතිය සම්පූර්ණ කර ඇති අතර සක්‍රීය ලෙස සහ කාර්යක්ෂම ලෙස ඩිජිටල්කරණය කරන ලද ලේඛන සොයා බැලීම සහ ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ නිලධරයන් විසින් දැන් වෙබ් අඩවිය භාවිත කරමින් සිටියි.

## 3. West Law දායක වීම

ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී, නීති ක්ෂේත්‍රයේ අලුත්ම ප්‍රවණතාවයක් සම්බන්ධයෙන් දැනුවත් කිරීමට නීති කෙටුම්පත් සම්පාදකවරුන්ට අතවශ්‍ය වේ. ඒ සඳහා සම්පත් පැවතීම සහ ඒවා සඳහා පහසුවෙන් ප්‍රවේශවීම ඉතා වැදගත් වේ. එම නිසා, නීති වෘත්තිකයන් සඳහා මාර්ගගත නීති පර්යේෂණ සේවයක් වන West Law සේවය ස්වකීය නිලධරයන්ට ලබා දීමට දෙපාර්තමේන්තුව අපේක්ෂා කරනු ලබයි. මේ සඳහා අවශ්‍ය අනුමතය භාණ්ඩාගාරයෙන් සහ අධිකරණ අමාත්‍යාංශයෙන් ලැබී ඇති අතර එම සේවාව ලබා ගැනීම පිණිස දෙපාර්තමේන්තුව විසින් දැනට කටයුතු කරමින් සිටී.

## 4. ලංකා රාජ්‍ය ජාලය

දෙපාර්තමේන්තුව ලංකා රාජ්‍ය ජාලය වෙත සම්බන්ධකර ඇත. නිලධරයන් සඳහා ලංකා රාජ්‍ය ජාලය යටතේ වූ නිල ඊමේල් ගිණුම් සාදනු ලැබ ඇත.
තව ද, මෙම දෙපාර්තමේන්තුව ලංකා රාජ්‍ය ජාලය 2.0 සඳහා තෝරාගෙන ඇති අතර මෙම ක්‍රියාවලියේ කොටසක් වශයෙන් වයිෆයි පහසුකම් ලබා දී ඇත.

**5.** විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ මන්ත්‍රීවරුන් පෞද්ගලිකව ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පත් කිරීම, හා පනත් සංශෝධන කෙටුම්පත් සඳහා වන ඉල්ලීම් කඩිනමින් සකස් කර භාෂාත්‍රයෙන් ඉදිරිපත් කිරීමට ගත යුතු පියවර පිළිබඳ සියලු නීති නිලධාරීන් නිරතුරුවම දැනුවත් කර ඇත.

**6.** පළපුරුදු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ හිඟය යම්තාක් දුරට මගහරවා ගැනීමට නීති කෙටුම්පත් කිරීමේ කාර්යයන් සඳහා උපදේශකවරුන් සිව්දෙනෙකු බඳවා ගෙන ඇත.

**7.** නීති නිලධාරීන්ගේ සහ අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ දැනුම හා හැකියාව වර්ධනය කිරීම ඉලක්ක කරගත් විවිධ පුහුණු වැඩසටහන්වලට සහභාගිවීම සඳහා පුළුල් පරාසයක විහිදුනු අවස්ථාවන් ඔවුන්ට ලබා දී තිබේ.

**8.** දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කොට ඇති 'අ' ශ්‍රේණියේ පුස්තකාලය මගින් දේශීය සහ විදේශීය නීති පොත් පරිශීලනය කිරීමේ පහසුකම් සපයා දී ඇත.

**9.** නීති නිලධාරීන් ඇතුළු දෙපාර්තමේන්තුවේ අනෙකුත් සියලුම කාර්ය මණ්ඩලය රාජකාරි වේලාවන්හි දී රාජ්‍ය සේවයේ ගෞරවය ආරක්ෂා වන පරිදි සේවයෙහි නියුතු විය යුතු බවට පැහැදිලි උපදෙස් නිරතුරුව ලබා දෙන අතර නීති නිලධාරීන් මෙන්ම අනෙකුත් සියලුම කාර්ය මණ්ඩල ආදර්ශවත් පරිදි ස්වකීය රාජකාරි කටයුතු ඉටු කරනු ලබන බව ද සඳහන් කළ යුතු ව ඇත.